චක්‍ර ලේඛ අංක : 12/95

මගේ අංකය: බප/ස.සේ.කො./ලේ.නි.
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,
මහලේකම් කාර්යාලය,
03 වන මහල,
මාළිගාවත්ත,
කොළඹ 10.
1995 ජූලි 17 දින.

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිතිවල
සභාපතිවරුන් වෙත.

වැටුප් ක්‍රමයේ අවසන් පියවරට පැමිණීම නිසා
වැටුප් වර්ධක ගෙවීම.

සමුපකාර සේවකයකු සිය වැටුප් පරිමාණයේ අවසාන පියවරට පැමිණි පසු නැවත වැටුප් වර්ධක හිමි නොවන නිසා, එම වැටුප් පරිමාණයේම තවදුරටත් සේවය කිරීමට සිදුවීම සේවකයාට සිදුවන බලවත් අසාධාරණයක් බැවින්, ඒ පිළිබඳ අවධානය යොමු කළ මෙම කොමිෂන් සභාව එවැනි සේවකයින්ට පහත සඳහන් පරිදි වැටුප් වර්ධක ලබා ගැනීමට අවස්ථාවක් සලසා දීම සුදුසු බැව් තීරණය කරන ලදී.

02. ඒ අනුව තම වැටුප් පරිමාණයේ අවසාන පියවර පැමිණි සේවකයකුට ඉදිරි වර්ෂ පහක (05) කාලයක් අවසන් වූ පසු එක වැටුප් වර්ධකයක් ද, ඉන් පසු එළඹෙන සෑම වර්ෂ තුනකට (03) වරක් එක් වැටුප් වර්ධකය බැගින් ද ගෙවිය යුතු වේ.

03. යථෝක්ත තීරණය අනුව ක්‍රියා කළයුතු බැව් කොමිෂන් සභාවේ නියමය පිණිදි දැනුම් දෙමි.

(පී.ඩී. චන්ද්‍රදාස)
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත.

පිටපත්:- 1. ප්‍රධාන ලේකම් (බ.ප.)
2. කෘෂිකර්ම, පළාත් පාලන හා සමුපකාර අමාත්‍යංශයේ ලේකම්, බස්නාහිර පළාත.
3. ස.සං.කො./රෙ.(බ.ප.)
4. සහකාර සමුපකාර සං.කොමසාරිස්, කළුතර/ ගම්පහ/ කොළඹ.
5. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව.
6. ප්‍රාදේශීය ලේකම්වරුන්